# Covid 19 සති පාසල - සබරගමු පළාත
# 9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය
# ඒකකය 9.3 ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
## <u>පැවරුම් අංක 6</u>

<u>ක්‍රියාකාරකම</u> - 9.3.5 ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස අවස්ථාවෝචිතව ස්ථිර භාවයෙන් කටයුතු කිරීම.

හැඳින්වීම - කටුක අභියෝගාත්මක අවස්ථාවක නොබියව, අවංකව, ඍජුව හා හෘද සාක්ෂියට එකඟව, අවස්ථාවට ගැළපෙන පරිදි, සදාචාරාත්මකව තම අදහස අවශ්‍යතාවය හෝ බලාපොරොත්තුව, ස්ථිර ලෙස ප්‍රකාශ කිරීම ස්ථිර භාවයයි .ස්ථිරසාර ලෙස කටයුතු කිරීමට සිදු වන අවස්ථා

උදාහරණ

- යම් අසාධාරණයක් වූ විට
- අසත්‍ය චෝදනාවක් එල්ල වූ විට
- කෝපයට පත් වූ පුද්ගලයකු සමඟ කතා කරන විට

මෙහිදී තම සිත තුළ ඇති වන අයහපත් සිතිවිලි තමා විසින්ම වැඩ පවත්වාගැනීම අදහස් කරයි.

<u>ගුණාත්මක යෙදවුම්</u> - පෙළපොත, පෑන්, අභ්‍යාස පොත, ස්ථිරසාර ගුණාංග දැක්වෙන පොත්, පත්තර යන ආදිය

<u>ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්</u> -

පියවර 1 පෙළ පොතේ පිටු අංක 84- 85 කියවන්න

පියවර 2 අභ්‍යාස පොත භාවිතා කර ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න

<u>ප්‍රශ්නාවලිය</u>

1. ස්ථිර භාවය යනු කුමක්දැයි අර්ථ ගන්වන්න.
2. ස්ථිර භාවය ගොඩනඟා ගැනීම සඳහා පුද්ගලයෙකු තුළ වර්ධනය කරගත යුතු ගුණාංග පෙල ගස්වන්න.
3. තමා සමඟ ස්ථිර භාවයෙන් කටයුතු කළ යුතු ආකාරය කරුණු තුනකින් පැහැදිලි කරන්න.
4. අනුන් සමග ස්ථිර භාවයෙන් කටයුතු කළ යුතු ආකාරය කරුණු තුනකින් පැහැදිලි කරන්න.
5. ක්‍රියාකාරකම 3.4 කරන්න.

<u>පසු වැඩ</u>

පහත සඳහන් අවස්ථා වලට ඔබට මුහුණ දීමට සිදු වුවහොත්, ඔබ ස්ථිරසාර ලෙස කටයුතු කරන්නේ කෙසේද ?

01. පාසලේ කිසියම් කාලච්ඡේදයකට සහභාගි නොවී සිටීමට යාලුවෙක් විසින් ඔබට යෝජනා කරනු ලැබූ අවස්ථාවක
02. සන්ධ්‍යා කාලයේ දී ආගමික වතාවත් වලයෙදෙන විට ඔබගේ සහෝදරයා රූපවාහිනිය අධික ශබ්දයෙන් යුතු ව ක්‍රියාත්මක කිරීම.
03. පන්තියේ යහළුවෙකු නියමිත දිනට පිරිසිදු කිරීම නොකර මගහැර සිටීම.

කෙටියෙන් පිළිතුරු සපයන්න.

සැකසුම - එම්. ඒ පත්මලතා මිය
- ර/නිවි/ පලාවෙල ශ්‍රී රත්නාකරමහා විද්‍යාලය, රත්නපුර